රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

## 2024-04-25 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. අධ්‍යාපනික සහයෝගිතාවය අරමුණු කර ගනිමින් අවබෝධතා ගිවිසුම්වලට/ගිවිසුම්වලට එළඹීම

උසස් අධ්‍යාපනික සහයෝගිතාවන් වර්ධනය කිරීමේ අරමුණින් මෙරට විශ්වවිද්‍යාල සහ විදේශීය විශ්වවිද්‍යාල/නියෝජිතායතන අතර පහත සඳහන් අවබෝධතා ගිවිසුම්වලට/ගිවිසුම්වලට එළඹීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* ආපදා සඳහා ඔරොත්තු දීමට සහ ස්වභාවික සම්පත් සමෝධානිත කළමනාකරණය සම්බන්ධයෙන් බහුවිධ පර්යේෂණවලට එළඹීම දිරිගැන්වීමට අදාළව ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සහ එක්සත් රාජධානියේ සැල්ෆර්ඩ් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* ගෝලීය සෞඛ්‍ය ප්‍රයත්නයන් සම්බන්ධීකරණය අරමුණු කර ගනිමින් කලාපීය සහයෝගිතා මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා යාපනය විශ්වවිද්‍යාලය සහ සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලය හා සිංගප්පූරු සෞඛ්‍ය සේවා (පුද්ගලික) සමාගම අතර ත්‍රෛපාර්ශ්වීය අවබෝධතා ගිවිසුම.

* ගෝලීය වශයෙන් කාන්තාවන්ට ආර්තවහරණයෙන් ඇති වන මානසික සෞඛ්‍ය බලපෑම පිළිබඳ මාරි ව්‍යාපෘතියට (MARIE Project) අදාළව රුහුණ විශ්වවිද්‍යාලය සහ එක්සත් රාජධානියේ හා උතුරු අයර්ලන්තයේ දකුණු සෞඛ්‍ය NHS භාරය අතර අවබෝධතා ගිවිසුම.

* චීනයේ සිසුන්ට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන අධ්‍යාපන වැඩසටහන් අනුමත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා එහි නිසි බලයලත් නියෝජිතයා ලෙස Tomorrow Technology Education Service Centre නම් කිරීමට සහ බලගැන්වීමට අදාළව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ චීනයේ Tomorrow Technology Education Service Centre අතර අවබෝධතා ගිවිසුම.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

* දෙපාර්ශ්වය අතර සහයෝගිතාව වර්ධනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා චෙක් ජනරජයේ තෝමස් බාටා විශ්වවිද්‍යාලය අතර වන අවබෝධතා ගිවිසුම.

* ධාරිතා ගොඩනැගීම, පර්යේෂණ සහයෝගිතා, නවෝත්පාදන සහ ජලජීවී වගා ජෛව පද්ධති තාක්ෂණය භාවිතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය සහ ඉතාලියේ නේපල්ස් ෆෙඩ්‍රිකෝ II විශ්වවිද්‍යාලය අතර ගිවිසුම.

## 02. පාසල් සිසුන් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන සතිමත් බව අභ්‍යාස කිරීමේ වැඩසටහන පුළුල් කිරීම

පාසල් සිසුන්ගේ මනසේ නිරන්තරයෙන් ඇති වන ව්‍යාකූල බව හා ආතතිය මග හරවා සන්සුන් බව ඇති කිරීම අරමුණු කර ගනිමින් "පාසල් සිසුන් සඳහා සතිමත් බව හඳුන්වා දීමේ වැඩසටහන" ක්‍රියාත්මක කිරීම පිණිස 2022-12-12 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, මේ වන විට වසරකට අධික කාලයක් පුරා දිවයිනේ සෑම පාසලකම එම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මකව පවතී. එම වැඩසටහනේ ඉදිරි පියවරක් වශයෙන් වාර්ෂිකව වෙසක් පොහොයට පසු දිනය ජාතික සති දිනය ලෙස සැමරීමටත්, වෙසක් සතියට සමගාමීව "වෙසක් සතියෙන් සතිමත් දේශයක් කරා" නමැති වැඩසටහන ඉදිරියේදී වාර්ෂිකව ක්‍රියාත්මක කිරීමටත්, 2024 වර්ෂයේ සිට සෑම වර්ෂයකම මැයි මස ආරම්භයේදී "ජාත්‍යන්තර සති සමුළුව" පැවැත්වීමටත් අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. මීගමුව ඒත්තුකාල වෙරළ උද්‍යානය සංවර්ධනය කිරීම පිණිස එකී උද්‍යානය පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම

අක්කර 06 රූඩ් 01 පර්චස් 9.1කින් සමන්විත ඒත්තුකාල වෙරළ උද්‍යානය (Browns beach) මහජනයා වෙනුවෙන් මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින එකම වෙරළ උද්‍යානය වන අතර, එය 2021-2030 මීගමුව සංවර්ධන සැලැස්මේ අධි ඝනත්ව සංචාරක ප්‍රවර්ධන කලාපය තුළ පිහිටා ඇත. එම වෙරළ උද්‍යානය දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා ආකර්ෂණීය උද්‍යානයක් බවට පත් කිරීම පිණිස එහි කළමනාකාරිත්වය

නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට මීගමුව මහ නගර සභාව විසින් තීරණය කර ඇත. ඒ අනුව, අදාළ සංවර්ධන සැලසුම්වලට අනුව සංචාරක කලාපයක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා එම උද්‍යානය පිහිටි ඉඩම රජයේ ඉඩම් ආඥාපනතේ විධිවිධාන පරිදි නිදහස් දීමනාවක් වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. Wetland Link International - Asia Oceaniaහි පළමු සමුළුව කොළඹ දියසරු උද්‍යානයේදී පැවැත්වීම

Wetland Link International (WLI) යනු තෙත්බිම් අධ්‍යාපන මධ්‍යස්ථාන සඳහා ජාත්‍යන්තර ආධාරක ජාලයක් වන අතර එක්සත් රාජධානියේ Wildfowl and Wetlands Trust (WWT) විසින් එහි ප්‍රධානත්වය දරනු ලබයි. WLI එකමුතුව මහාද්වීප 06 ක් පුරා විසිරුණු තෙත්බිම් අධ්‍යාපන මධ්‍යස්ථාන 350 කින් සමන්විත වේ. ආසියාවේ තෙත්බිම් වැඩිදියුණු කිරීම සඳහා WLI ට අනුබද්ධිතව WLI Asia (Wetland Link International Asia) පිහිටුවා ඇති අතර, එය සාමාජික තෙත් බිම් 100කින් සමන්විත වේ. ඊට අමතරව, 2022 වර්ෂයේදී WLI Asia එකමුතුව විසින් ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ තෙත්බිම් මධ්‍යස්ථාන සමඟ ද එක්ව WLI- Asia Oceania නැමති එකමුතුව පිහිටුවා ගනු ලැබ තිබේ. WLI-Asia Oceania හි පළමු සමුළුව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව යටතේ පාලනය වන දියසරු උද්‍යානයේ සත්කාරකත්වයෙන් 2024 ජූනි මස 16 දින සිට 22 දින දක්වා, රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන අංග සහිතව MICE (Meetings, Incentives, Conferences and Exhibitions) සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස කොළඹ දී පැවැත්වීමට යෝජනා වී ඇත. ඒ අනුව, විදේශ දූත කණ්ඩායම් 100ක සහ දේශීය කණ්ඩායම් 75ක සහභාගීත්වයෙන් එකී සමුළුව කොළඹ දී පැවැත්වීම සඳහා සහ එහි සත්කාරකත්වය දැරීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 05. හෝමාගම, පිට්පන පිහිටි ඉඩම් කොටස් දෙකක් (02) සීමාසහිත ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය (NSBM) වෙත ලබා දීම

හෝමාගම නගර සංවර්ධන සැලැස්ම යටතේ "දැනුම කේන්ද්‍රීය නගරය" සංකල්පයට අනුව විද්‍යා හා තාක්ෂණ අංශ දියුණු කිරීම ප්‍රමුඛ කොට ගෙන ඒ සඳහා අවශ්‍ය බිම් කොටස් වෙන් කර දීමේ අරමුණින් හෝමාගම, පිට්පන පිහිටි මාහේනවත්ත නමැති අක්කර 237ක ඉඩම නාගරික

සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කර ගනු ලැබ ඇත. එම ඉඩමින් අක්කර 14 රූඩ 03 පර්චස් 12.8ක් වූ ඉඩම් කොටසක් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනයේ II අදියර ඉදි කිරීම සඳහා සහ තවත් අක්කර 20ක පමණ බිම් කොටසක් එහි III අදියර ඉදි කිරීම සඳහා රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම අය කිරීමට යටත්ව, දිගුකාලීන බදු පදනම මත ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය වෙත ලබා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. බලශක්ති අංශය සඳහා නව නියාමන ආයතනයක් හඳුන්වා දීම

පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ගුවන් යානා ඉන්ධන තෙල්, ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු (LPG) සහ ලිහිසි තෙල් ඇතුළු ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදු කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම දැනට පවතින නීති රාමුව තුළ ක්‍රියාත්මක වුවද, මෙම අංශයට පුළුල් නියාමන යාන්ත්‍රණයක් නොමැත. පුද්ගලික ආයතන රාශියක් ද ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය සහ බෙදා හැරීම සඳහා සම්බන්ධ වී සිටින බැවින් එම අංශයේ අභියෝගවලට විසඳුම් සෙවීම, නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ පාරිභෝගිකයින්ගේ, ආයෝජකයන්ගේ හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ස්වාධීන, ගතික, ඵලදායී හා කාර්යක්ෂම නියාමන යාන්ත්‍රණයක අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. එබැවින්, ඒ පිළිබඳව කරුණු අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සහ නීතිමය රාමුවක් සකස් කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංගමයේ (IORA) සභාපතිත්වය ශ්‍රී ලංකාව විසින් භාර ගැනීමෙන් අනතුරුව 2024 වර්ෂය තුළදී ඉටු කළ යුතු කාර්යයන්

ඉන්දියන් සාගරයට මායිම් වන සාමාජික රටවල් 23කින් සමන්විත ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංගමයේ (IORA) සභාපතිත්වය වසර 02ක කාලයක් සඳහා ශ්‍රී ලංකාවට ලැබීමෙන් අනතුරුව, 2024 වර්ෂය තුළදී නිල රැස්වීම් කිහිපයක් සංවිධානය කිරීම ශ්‍රී ලංකාව විසින් සිදු කළ යුතුව ඇත. ඒ අනුව, පහත සඳහන් පරිදි නිල රැස්වීම් ශ්‍රී ලංකාව තුළ

පැවැත්වීම සහ ඊට අදාළ සත්කාරකත්වයන් දැරීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

i. ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංගමයේ (IORA) ජ්‍යෙෂ්ඨ නිලධාරි කමිටුවේ 26 වන රැස්වීම 2024 මැයි මස 30 සහ 31 දිනයන්හිදී පැවැත්වීම.

ii. ජ්‍යෙෂ්ඨ නිලධාරි කමිටුවේ 27 වන වාර්ෂික රැස්වීම 2024 නොවැම්බර් මාසයේදී පැවැත්වීම.

iii. 24 වන අමාත්‍ය මට්ටමේ රැස්වීම 2024 නොවැම්බර් මාසයේදී පැවැත්වීම.

## 08. 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම

ගුවන් සේවා කර්මාන්තයේ භාවිතයන්, මාර්ග සහ සීමා කිරීම් දිනෙන් දින පුළුල් වෙමින් පවතින බැවින්, රටෙහි සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තියට, කර්මාන්තයේ අවශ්‍යතාවන්ට සහ සිවිල් ගුවන් සේවාවේ ගෝලීය ප්‍රවණතාවන්ට ගැළපෙන පරිදි 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය බව හඳුනාගෙන ඇත. ඒ අනුව, ඒ සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීම පිණිස පත් කරනු ලැබ ඇති කමිටුවේ නිර්දේශ මත පදනම්ව එකී පනත් සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පත් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 09. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි කළමනාකාරිත්වය භාර දීම

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පහසුකම් භාවිත කිරීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවීම සඳහා 2023-01-09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවා ඇති අතර, ආයතන 05ක් විසින් අභිලාෂ ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවේ නිර්දේශය පරිදි මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි

කළමනාකරණය ඉන්දියාවේ M/s Shaurya Aeronautics (Pvt) Ltd සහ රුසියාවේ Airports of Regions Management Company වෙත හෝ එහි බද්ධ ව්‍යවසායයක් වෙත වසර 30ක කාලසීමාවක් සඳහා පැවරීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. අපරාධයකින් උපයාගත් දේපළ පිළිබඳ පනත් කෙටුම්පත

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විස්තීරණ ණය පහසුකම ලබා ගැනීම සඳහා එළඹ ඇති ගිවිසුම අනුව, 2024 වර්ෂය වන විට වත්කම් අය කර ගැනීම සම්බන්ධයෙන් පරිපූර්ණ නීතියක් හඳුන්වා දීමට ශ්‍රී ලංකා රජය විසින් පියවර ගත යුතු වේ. ඒ අනුව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් අපරාධයකින් උපයාගත් දේපළ පිළිබඳ නීතිය සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රතිපත්ති හා නීතිමය රාමුව සහ ක්‍රියාපටිපාටිය සකස් කිරීම පිණිස 2023 මාර්තු මාසයේදී අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරනු ලැබ ඇත. එම කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාවේ දක්වා ඇති නිර්දේශ මත පදනම්ව අපරාධයකින් උපයාගත් දේපළ පිළිබඳ පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් ලබා දීම පිණිස ගරු ජනාධිපතිතුමා සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 11. ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණය සහ 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 80(3) වගන්තිය අනුව සෑම මුදල් වර්ෂයක්ම අවසන් වී සිව් මසක කාලයක් තුළ එම මුදල් වර්ෂය තුළ පැවති ආර්ථික තත්ත්වය පිළිබඳ වාර්තාවක් මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුව ඇත. ඊට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 99(3) වගන්තිය අනුව සෑම මුදල් වර්ෂයක්ම අවසන් වී සිව් මසක කාලයක් තුළ මහ බැංකු අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් අත්සන් තබන ලද සහ විගණකාධිපති විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ද පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව, 2023 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින්

සකස් කරනු ලැබ ඇති වාර්ෂික ආර්ථික විවරණය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **රජයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය කිරීම සඳහා පළාත් පාලන ආයතන මට්ටමින් ප්‍රජා උපදේශක කමිටු පත් කිරීම**

ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ගේ ජීවන තත්ත්වය යහපත් කිරීම සඳහා රජය විසින් විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතින අතර, එකී වැඩසටහන් සහ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධ කර ගැනීම මගින් පාලනයෙහි විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම යෝග්‍ය බවට පෙනී ගොස් ඇත. එසේම, ප්‍රජාවගේ දැනුම සහ සහභාගිත්වය එකී වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා ලබා ගැනීමට සහ එක් එක් ප්‍රදේශයේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා එම වැඩසටහන් සකස් කර ඇති බව සහතික කර ගැනීමට එමඟින් හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව, උරුමය ඉඩම් හිමිකාරිත්ව වැඩසටහන, නාගරික නිවාස හිමිකාරිත්ව වැඩසටහන, කඳුකර දශකය වැඩසටහන, කෘෂිකර්ම නවීකරණ වැඩසටහන සහ සහල් බෙදා දීමේ වැඩසටහන යන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව අධීක්ෂණය කිරීම සඳහා ප්‍රජා උපදේශක කමිටු ගරු කටයුතු පදනමින් පත් කිරීම සඳහා පළාත් ආණ්ඩුකාරවරුන් වෙත බලය පැවරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***********